# 10. පාසලේ දී දෙවිඳු යදිමු

අමර නයනා කමලා හා පන්තියේ අනෙක් මිතුරු මිතුරියන් කිතු දහම පාඩම සඳහා ගුරුතුමී සමග පාසල් වත්තේ මාර ගස යටට ගියා.

ගුරුතුමී මාර ගස යට තිබූ බංකුවේ ඉඳ ගත්තා. ළමයි සැම දෙනා ම ගුරුතුමී වටේ වාඩි වුණා. ගුරුතුමී ඔවුන්ට එදා වටිනා පාඩමක් කියා දුන්නා. ඉන් පසුව ඔවුන් සමග දේව පියා අමතා කතා කරන්න සැරසුණා.

ගුරුතුමී : හැම දෙනා ම දැන් ඇස් පියා ගන්න. නිශ්චල වෙන්න.
අපි ළඟ දේව පියා සිටිනා බව මතක් කරගන්න.

සියලු දෙනා ම මද වේලාවක් නිශ්චල ව සිටියා. ඉන් පසුව ගුරුතුමිය සමග පේළියෙන් පේළිය මෙසේ කීවා.

ආදර දේව පියේ

මේ මොහොතේ අප සමග සිටීම ගැන ස්තූතියි. මේ ලස්සන ලෝකය අපට දීම ගැන ද, අපට ආදරය කරන සියලූ දෙනා ගැන ද, ස්තූතියි. සැම විට යහපත් දේ කරන්නට ද අපට වැරදි කරන අයට සමාව දෙන්නට ද, සැම දෙනා සමග සාමයෙන් සිටින්නට ද අපට වරම් දෙන්න.

ආමෙන්.

ගුරුතුමී සමග දේව පියාට කතා කළ ළමයි සියලූ දෙනා ම සතුටින් නැවතත් තම පන්තියට ගියා.

## පැවරුම්

1. පෙළ පොතේ දී ඇති යච්ඤාව සියලූ දෙනා එක් ව හඬ නගා කියවන්න.
2. පාසලේ දී ඔබට කළ හැකි කුඩා යාච්ඤාවක් සරල වචන වලින් ලියන්න.